# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


2011.03.08

ප්‍රවෘත්ති සංස්කාරක/ අධ්‍යක්‍ෂ,

## පළාත් පාලන මැතිවරණය - 2011.03.17

## තැපැල් ඡන්ද නිරීක්‍ෂණය - පළමු දින වාර්තාව 2011 මාර්තු 08

2011 වර්ෂයේ පළාත් පාලන ආයතන 235කට නියෝජිතයන් තෝරා පත්කර ගැනීම සඳහා වන මැතිවරණ 2011 මාර්තු 17 වන දින පැවැත්වීමට මැතිවරණ කොමසාරිස්තුමා සියළු කටයුතු සූදානම් කරමින් සිටී. එහිදී ඊට අදාළ තැපැල් ඡන්දය භාවිත කිරීම සඳහා වන ඡන්ද විමසීම 2011-03-08 එනම් අද දින පැවැත්වූ අතර 2011.03.09 එනම් හෙට දිනයේදී ද පැවැත්වීමට නියමිතය. පළාත් පාලන ආයතන 301ක් සඳහා පිළිගත් තැපැල් ඡන්ද අයදුම්පත් 321595 ක් වූ අතර, ඒ අතරින් 2011.03.08/09 යන දෙදින තුළ එනම් පළාත් පාලන ආයතන 235ට අදාළ තැපැල් ඡන්දදායකයින් ප්‍රමාණය 257093කි. පළාත් පාලන ආයතන 301ක් සඳහා පිළිගත් අයදුම්පත්‍ර සංඛ්‍යාව, 2010 පාර්ලිමේන්තු මැතිවරණයේ පිළිගත් අයදුම්පත් 415432 ට සාපේක්‍ෂව අයදුම්පත් ලක්‍ෂයක පමණ අඩුවීමකි. එහෙත් එහිදී පළාත් පාලන ආයතන 34ක් සඳහා තැපැල් ඡන්ද ඉල්ලුම් නොකළ බවද සඳහන් කළ යුතුය.

පැෆ්රල් සංවිධානය විසින් තැපැල් ඡන්ද නිරීක්‍ෂණය සඳහා ඡන්දය පවත්වනු ලබන පළාත් පාලන ආයතන 235 ආවරණය වන ලෙස තෝරාගත් මධ්‍යස්ථාන සඳහා ස්ථානගත නිරීක්‍ෂකයන් 300ක පමණ ප්‍රමාණයක් යොදවන ලදී. ඒ අනුව සැළකිය යුතු ඡන්ද ප්‍රමාණයක් සහිත සහ දේශපාලන වශයෙන් සංවේදීභාවයක් සහිත පොලිසි, ගමනාගමන මණ්ඩල, යුධ හමුදා කඳවුරු, සහ කළාප අධ්‍යාපන කාර්යාල ආදී ඡන්ද මධ්‍යස්ථාන නිරීක්‍ෂණය කිරීම සඳහා අපගේ නිරීක්‍ෂකයන් යොදවනු ලැබීය.

රාජකාරි හේතුන් මත තැපැල් ඡන්ද භාවිත නොවූ ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක් අද දින අප නිරීක්‍ෂණයට ලක් වූ අතර, දේශපාලන පක්‍ෂ නියෝජිතයින් 65% - 70%ක් පමණ ඡන්ද මධ්‍යස්ථානවල තැපැල් ඡන්දය නිරීක්‍ෂණයේ යෙදී සිටිනු දැකගත හැකිවිය.

අපගේ නිරීක්‍ෂණයන්ට අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ කඩවත ප්‍රදේශයේ ගමනා ගමන මණ්ඩලයේ තිබූ තැපැල් ඡන්ද මධ්‍යස්ථානයට පළාත් පාලන මැතිවරණය සඳහා තරඟ කරනු ලබන අපේක්‍ෂකයන් තුන් දෙනෙක් ඇතුළුවීම පිළිබඳ සිද්ධියක් වාර්තා වූ අතර මහනුවර ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථානයකට එක්සත් ජාතික පක්‍ෂයේ ඡන්දපොළ නියෝජිතයකුට ඇතුලුවීමට ඉඩ නොලැබීමේ සිදුවීමක් ද වාර්තා විය.

ඉහත සිදුවීම් හැරුණු කොට, බරපතළ සිදුවීම් කිසිවක් වාර්තා නොවූ අතර 50% - 60% ත් අතර ප්‍රමාණයක් අද දිනයේදී තැපැල් ඡන්ද භාවිත කරන ලද නමුත් එය පසුගිය මැතිවරණවලට සාපේක්‍ෂව අඩු ප්‍රමාණයකි. තැපැල් ඡන්දයේ පළමු දින සාමකාමී පරිසරයක් පැවති අතර, හඳුනාගත් ඡන්ද මධ්‍යස්ථාන සඳහා විශේෂ නිලධාරීන් යෙදීමට මැතිවරණ කොමසාරිස්වරයා ගනු ලැබූ ක්‍රියාමාර්ග ද මේ සඳහා ඉවහල් වන්නට ඇතැයි අප විශ්වාස කරන අතර හෙට දිනයේත් මෙකී තත්ත්වය පවත්වාගනිමින් ඉතිරි ඡන්ද ප්‍රමාණය භාවිත කරනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු.

එමෙන්ම මාර්තු 17 වන දින ඡන්ද විමසීම සඳහා ඉදිරියට තවත් සතියක පමණ කාලයක් පමණක් ඇති හෙයින්, මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය නිදහස් හා සාධාරණ පරිසරය ඉදිරි සතිය තුළත්, මැතිවරණ දිනයේත්, ඊට පසුවත් පවත්වා ගෙන යාමට අවශ්‍ය සහයෝගය මැතිවරණ කොමසාරිස්තුමා ඇතුළු මැතිවරණ දෙපාර්තමේන්තුවට ලබා දීමට පොලිසිය, දේශපාලන පක්‍ෂ නායකයන්, අපේක්‍ෂකයන් හා අනෙකුත් සිවිල් සංවිධාන මාධ්‍ය මෙන්ම මහජනතාව ද ක්‍රියාකරනු ඇතැයි අප විශ්වාස කරන අතර ඒ සඳහා ක්‍රියාකරන මෙන් ද කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි

මෙයට විශ්වාසී

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්‍ෂ


# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 6, Sri Lanka.
Tel : (+94) 11 2514441, 11 2514442 Fax : (+94) 11 2514443
E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk